වාර්ෂික වාර්තාව

# 2022

2022 මහ බැංකු වාර්ෂික වාර්තාවෙන් පිළිබිඹුවන

# ශ්‍රී ලංකා ආර්ථිකය

## අභියෝග, ප්‍රතිපත්ති සහ ඉදිරි දැක්ම



**ආචාර්ය ලසිත පත්බේරිය**

අතිරේක අධ්‍යක්ෂ

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව



2023 මැයි 11




## මුදල් නීති පනතෙහි 35වන වගන්තිය:

...සෑම මුදල් වර්ෂයක් අවසාන වීමෙන් පසුව මාස හතරක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුවේ තත්ත්වය ද, එම මුදල් වර්ෂය තුළ මුදල් මණ්ඩලය මගින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිළිබඳ සමාලෝචනයක් සහ මෙම ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට හේතු වූ ආර්ථික හා මූල්‍ය තත්ත්වයන්ගේ විශ්ලේෂණයක් ද ඇතුළත් වාර්ෂික වාර්තාවක් මුදල් විෂය භාර අමාත්‍යවරයාට ඉදිරිපත් කිරීම හා ප්‍රකාශයට පත් කිරීම මුදල් මණ්ඩලය විසින් සිදු කළ යුතු වේ...

# වාර්ෂික වාර්තාවේ පෙළගැස්ම




| | | | |
|---|---|---|---|
| I වන වෙළුම | I කොටස | - | ආර්ථිකයේ තත්ත්වය, එහි ක්‍රියාකාරිත්වය, ප්‍රතිපත්ති සහ ගැටලු<br>සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය<br>විශේෂ සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය |
| II වන වෙළුම | II කොටස | - | ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් සහ කටයුතු |
| | III කොටස | - | මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩකටයුතු හා මෙහෙයුම්වලට අදාළ රජය හා මුදල් මණ්ඩලය විසින් වසර තුළදී උපයෝගී කරගනු ලැබූ පරිපාලන විධිවිධාන |
| | IV කොටස | - | 2022 වසරේ දී සම්මත කරන ලද මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩකටයුතු හා මෙහෙයුම්වලට අදාළ ප්‍රධාන නීති අණපනත් |

ශ්‍රී ලංකා ආර්ථිකය

නිදහසින් පසු ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ

වඩාත් අසීරුතම කාලපරිච්ඡේදය සඳහා

2022 වසරේ දී මුහුණ දුන්නේය...

- ශීඝ්‍රයෙන් අයහපත් වෙමින් පැවති ආර්ථික තත්ත්වයන් තවදුරටත් පිරිහීම වැළැක්වීම සඳහා **කඩිනම්** සහ **මනාව සම්බන්ධීකරණය** වූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය විය
- ප්‍රතිපත්ති පිළියම් ක්‍රියාමාර්ග මගින් විශාල පිරිසකට **කෙටි කාලීනව බලපෑම්** ඇති වුවද, දැඩි ආර්ථික **අස්ථාවරවීම්** මගින් ඇති විය හැකි අයහපත් ප්‍රතිඵලවලින් ආර්ථිකය සහ පුරවැසියන් **ආරක්ෂා** කර ගැනීම සඳහා එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය විය
- මෙම ප්‍රයත්නයන්හි අපේක්ෂිත **ප්‍රතිඵල** 2022 වසරේ අග භාගයේ සිට **දක්නට ලැබුණු** අතර එය සමාජ-ආර්ථික **ස්ථායීතාව** නැවත ස්ථාපිත කිරීම සඳහා උපකාරී විය
- තිරසාර පදනමක් මත ස්ථායීතාව සහතික කරලීම සඳහා **අභියෝග** තවමත් පවතී

# මූර්ත ආර්ථිකය මේ දක්වා වාර්තා වූ දරුණුතම ආර්ථික පසුබෑම සනිටුහන් කරමින්, 2022 වසරේ දී 7.8%කින් සංකෝචනය විය...

මූර්ත ද.දේ.නි. **2021** වසරේ වාර්තා වූ **3.5%ක වර්ධනයට** සාපේක්ෂව, **2022** වසරේ දී **7.8%කින් සංකෝචනය විය**

***2022 වසරේ දී සියලුම ආර්ථික අංශවල පසුබෑමක් වාර්තා විය***

| | | |
|---|---|---|
| සේවාවන් | -2.0% | දේපළ වෙළඳාම් කටයුතු => -12%<br>මූල්‍ය සේවා => -11%<br>රක්ෂණය => -47% |
| කර්මාන්ත | -16.0% | ඉදිකිරීම් කර්මාන්ත => -21%<br>නිෂ්පාදන කර්මාන්ත => -13% |
| කෘෂිකර්මාන්තය | -4.6% | වී වගාව => -13%<br>තේ වගාව => -16%<br>කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන්=> -13% |
| බදු-සහනාධාර | -27.1% | |

## සමස්ත ආර්ථිකයේ ප්‍රමාණය (එ.ජ. ඩොලර් බිලියන)

2021: 88.5

-12.9%

2022: 77.1


ඒක පුද්ගල ද.දේ.නි. (එ.ජ. ඩොලර්) 3,997

ඒක පුද්ගල ද.දේ.නි. (එ.ජ. ඩොලර්) 3,474

# උද්ධමනය ඉතිහාසගත ඉහළ මට්ටමක් කරා ළඟා විය...

- ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම
- සැපයුම් හිඟය
- මහ බැංකුව හරහා විශාල ලෙස රාජ්‍ය මූල්‍යනය සිදු කිරීම
- ගෝලීය බලශක්ති සහ ආහාර උද්ධමනය

*යනාදිය හේතුවෙන් සැලකිය යුතු ලෙස උද්ධමනය ඉහළ ගිය අතර එමගින් සමාජයේ සෑම අංශයකටම බලපෑම් ඇති කළේය*



උද්ධමනය (කො.පා.මි.ද. පදනම් වූ) සැප්තැම්බර් මාසයේ දී සියයට **69.8%** අගයක් වාර්තා කරමින් **ඉතිහාසගත ඉහළ මට්ටමක්** කරා ළඟා විය

| **වාර්ෂික ලක්ෂ්‍යමය** (කො.පා.මි.ද.,2013=100) | **2021 දෙසැ.** | **2022 සැප්.** |
|---|---|---|
| මතුපිට උද්ධමනය | 12.1% | 69.8% |
| මූලික උද්ධමනය | 8.3% | 50.2% |
| ආහාර උද්ධමනය | 22.1% | 94.9% |
| ආහාර නොවන උද්ධමනය | 7.5% | 57.6% |



**ඉහළ උද්ධමනය හා උද්ධමන අපේක්ෂා පාලනයෙන් තොර වීම**

# 2022 වසරේ දී විදේශීය අංශය දැඩි ගෙවුම් තුලන පීඩනයන්ට ලක් විය...

විදේශ විනිමය ද්‍රවශීලතාව පහත වැටීම හේතුවෙන් අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල හිඟයන් ඇති විය

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ
**එ.ජ.ඩො. මිලියන 205**
දක්වා අඩු විය
2022 පෙබ

**එ.ජ.ඩො. මිලියන 585**
2018 (මාසික සාමාන්‍යය)

වෙළඳ හිඟය පුළුල් විය
**එ.ජ.ඩො. බිලියන 1.1**
(2021 දෙසැ.)
එ.ජ.ඩො. මිලියන 781
*(සාමාන්‍යය)*
*2022 ජන. - අප්‍රේ.*

සංචාරක ඉපැයීම් අඩු විය
**එ.ජ.ඩො. මිලියන 41**
2022 සැප්.

**එ.ජ.ඩො. මිලියන 365**
2018 (මාසික සාමාන්‍යය)

පාවිච්චි කළ හැකි නිල සංචිත ***තීරණාත්මක මට්ටම්වලට අඩු විය***
**එ.ජ.ඩො. මිලියන 20**
2022 අප්‍රේ.

විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම් ඉහළ ගියේය

| | එ.ජ.ඩො. බිලියන |
|---|---|
| 2021: | 6.8 |
| 2022 (පුරෝ.)*: | 7.6 |
| 2022: කාර්.1: | 2.5 |
| 2022: කාර්.2-කාර්.4: | 0.7 |

*ණය සේවාකරණය අත්හිටුවීම ප්‍රකාශයට පත් කිරීමට පෙර

දළ නිල සංචිත අඩු විය
**එ.ජ.ඩො. බිලියන 1.7**
2022 ඔක්.


රුපියල්

විනිමය අනුපාතිකයෙහි ක්‍රමානුකූල ගැළපීමකට ඉඩ සලසන ලදී

වෙළඳපොළ සමපේක්ෂණය හේතුවෙන් අධික අවප්‍රමාණය වීමක් සිදු විය


එ.ජ. ඩොලරයට රුපියල් අවප්‍රමාණය වීම
**44%**
2022 මාර්. 08 - මැයි 12

# විදේශ විනිමය හිඟය මධ්‍යයේ, ආර්ථික ක්‍රියාකාරකම්වල සැලකිය යුතු පසුබෑමක් ඇති කරමින් විදුලිබල හා බලශක්ති අංශයේ අවදානම් උත්සන්න විය...




- **2022 වසරේ පැවති ඉන්ධන අර්බුදය දැඩි සමාජ අපහසුතාවයකට සහ නොසන්සුන්තාවකට හේතු විය**
  - ලං.බ.නී.සං.හි මූල්‍ය තත්ත්වය අයහපත් වීම
  - දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පැවති ද්‍රවශීලතා හිඟය
- **අධික ලෙස ඉන්ධන තොග ගබඩා කිරීම සහ ඉන්ධන ලබා ගැනීම සඳහා දිගු පෝලිම් නිර්මාණය වීමට හේතු වූයේ;**
  - ඉන්ධන බෙදාහැරීමේ අවිධිමත්භාවය
  - ඉන්ධන සැපයුම පිළිබඳ අවිනිශ්චිතතා

2022 වසරේ දෛනික විදුලි කප්පාදුව (මිනිත්තු)



# දශක කිහිපයක් පුරා රාජ්‍ය මූල්‍ය අංශයේ පැවති අසමතුලිතතාවන්, 2022 වසරේ දී තීරණාත්මක සංධිස්ථානයකට ළඟා විය...

## රාජ්‍ය ආදායම

ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස

**8.2%**

**ලොව පුරා වාර්තා වූ අඩුම අගයන්ගෙන් එකකි**

## රාජ්‍ය වියදම්

ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස

**18.5%**

**වියදම් දෘඪව පැවතීම**

## සමස්ත අයවැය හිඟය

ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස

**10.2 %**

**වසර 20ක් තුළ තෙවැනි ඉහළම අයවැය හිඟය**

## රාජ්‍ය ණය

ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස

**113.8%**

**මධ්‍යම රජයේ ණය තිරසාර නොවන මට්ටමකට ළඟා විය**

ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින්, 2020 ජනවාරි මාසයෙන් ආරම්භ කර 2021 වසරේ දෙවන භාගයේ සිට **2022 වසරේ මුල් අවධිය** දක්වා කාලය තුළ දී **ඉතා වේගයෙන්** **ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම** හේතුවෙන් **විදේශීය මූල්‍යන ප්‍රවේශයන් සීමා විය**

# මුදල් අංශයේ ක්‍රියාකාරිත්වය මගින් ද අර්බුදයේ බලපෑම සහ ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරයි...

- මහ බැංකුව මගින් රජය වෙත මූල්‍යන ලබා දීම ඉහළ ගියේය
- බැංකු පද්ධතිය මගින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය වර්ධනය විය

මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය

*2021 අවසානය* **1.2** රු. ට්‍රිලියන

*2022 අවසානය* **1.3** රු. ට්‍රිලියන

**2022 ජූනි මාසයේ සිට පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය අඛණ්ඩව සංකෝචනය විය**

**රු. බිලියන -494**

*(ජූනි 22 - පෙබ. 23)*

**මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් සෘණ අගයන්ට පත්වී පහළම මට්ටම් වාර්තා කරන ලදී**

*2022 අවසානය වන විට*

**-1.6** රු. ට්‍රිලියන ≈ **-4.4** එ. ජ. ඩොලර් බිලියන

බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය ඉතිහාසයේ ඉහළම අගය වාර්තා කරන ලදී

**29.7%**

*නොවැ. - 2022*

රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ඉහළ මට්ටම් දක්වා වැඩි විය

**33.1%**

*නොවැ. - 2022*
*(දින 91 රජයේ සුරැකුම්පත්)*

# නිදහසින් පසු ඇතිවූ උග්‍රතම ආර්ථික අර්බුදයෙන් පැන නැගුණු අභියෝගයන්ට මුහුණ දීමට මූල්‍ය පද්ධතියට හැකි විය...

## බැංකු අංශය

**ණයවල ගුණාත්මකභාවය අඛණ්ඩව පහළ යෑම, ද්‍රවශීලතාව මත ඇති වූ දැඩි පීඩනය, අඩු මට්ටමේ ලාභදායීත්වය, සහ ප්‍රාග්ධන මට්ටම් පිරිහීම** හේතුවෙන් පැන නැගුණු අභියෝගවලට බැංකු අංශය මුහුණ දුන්නේය.

| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර) | අක්‍රීය ණය අනුපාතය (%)(අ) |
|---|---|
| 1.0% ▼ | 11.3% ▲ |
| 2021: 1.4% | 2021: 7.6% |

| ප්‍රාග්ධන ප්‍රමානාත්මකතාවය (%) | ණය වර්ධනය (%) |
|---|---|
| 15.3% ▼ | 5.7% ▼ |
| 2021: 17.9% | 2021: 14.5% |

(අ) සමස්ත ණයට අදියර 3 ණය අනුපාතය අනුව

## බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය

**ණය වර්ධනයේ අඩුවීම, ලාභදායීත්වය පහළ වැටීම සහ අක්‍රීය ණය වැඩි වීම** වැනි අභියෝග මධ්‍යයේ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය ක්‍රියාත්මක විය

| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර) | අක්‍රීය ණය අනුපාතය (%)(ආ) |
|---|---|
| 3.7% ▼ | 17.5% ▲ |
| 2021: 5.4% | 2021: 11.0% |

| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය (%) | ණය වර්ධනය (%) |
|---|---|
| 22.0% ▲ | 5.0% ▼ |
| 2021: 17.0% | 2021: 9.9% |

(ආ) සමස්ත ණයට අදියර 3 ණය අනුපාතය අනුව

## කොටස් වෙළඳපොළ

...ස්ථාවර ආදායම් සුරැකුම්පත් සඳහා පැවති ඉහළ ඵලදා අනුපාතික සහ **අහිතකර වෙළඳපොළ අපේක්ෂා** පිළිබිඹු කරමින් කොටස් වෙළඳපොළ 2022 වසර තුළදී **දුර්වල කාර්යසාධනයක්** වාර්තා කළේය...

| සමස්ත කොටස් මිල දර්ශකය (ඇ) |
|---|
| -30.6% |

| S&P SL20 දර්ශකය(ඇ) |
|---|
| -37.7% |

| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය(ඇ) |
|---|
| -29.9% |

(ඇ) වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස

# ආර්ථික අර්බුදය පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට දැඩි දුෂ්කරතා ඇති කළේය

# උද්ධමනය ඉහළ යෑම මහජනතාවගේ ජීවන තත්ත්වය දැඩි ලෙස පිරිහීමට සහ ව්‍යාපාරවලට සැලකිය යුතු දුෂ්කරතා ඇති කිරීමට හේතු විය...


## මිල ගණන් ඉහළ යෑම

**2022 වසර තුළ තෝරාගත් කාණ්ඩවල ඉහළම වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (2013=100)**

| | |
|---|---|
| ගෑස් | 240% (අගෝ. ) |
| පුද්ගලික ප්‍රවාහනය සඳහා වන ඉන්ධන | 207% (ජූලි ) |
| පාන් සහ බේකරි නිෂ්පාදන | 183% (අගෝ. ) |
| මගීන් ප්‍රවාහනය | 145% (අගෝ. ) |
| ගෘහ නඩත්තුව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ | 120% (අගෝ. ) |
| ජල සැපයුම | 120% (ඔක්. ) |
| මස් | 119% (ඔක්. ) |
| පුද්ගලික සනීපාරක්ෂක නිෂ්පාදන | 116% (දෙසැ. ) |
| විදුලිය | 114% (නොවැ. ) |
| පළතුරු | 108% (දෙසැ. ) |
| මාළු සහ මුහුදු ආහාර | 99% (සැප්. ) |
| කිරි, චීස් සහ බිත්තර | 98% (අගෝ. ) |
| ආපනශාලා වලින් මිලදී ගන්නා සැකසූ ආහාර | 97% (සැප්. ) |
| කුළුබඩු සහ වෙනත් ආහාර | 94% (ජූලි ) |
| සහල් | 94% (සැප්. ) |
| එළවළු | 90% (ජූනි. ) |

අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟ වීම හා සලාකකරණය, **ජීවන වියදම** හා **නිෂ්පාදන පිරිවැය අධික ලෙස ඉහළ යෑම** සහ සුබසාධනය හා ජීවනෝපායන් අහිමිවීම් මධ්‍යයේ ව්‍යාපාර මෙන්ම සාමාන්‍ය ජනතාව ද එක සේ දැඩි පීඩාවට පත් විය

## ඉහළ නිෂ්පාදන පිරිවැය



## සෘණ මූර්ත ප්‍රතිලාභ




## මූර්ත වැටුප් පහත වැටීම



**රාජ්‍ය අංශය**
නාමික ↑ 16.1%
මූර්ත ↓ 20.6%




**විධිමත් පෞද්ගලික අංශය**
නාමික ↑ 9.8%
මූර්ත ↓ 22.7%



**අවිධිමත් පෞද්ගලික අංශය**
නාමික ↑ 24.8%
මූර්ත ↓ 17.5%

# පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම මගින් පෙර පැවති ආදායම් විෂමතා උත්සන්න කරමින් අවදානමට ලක්විය හැකි කුටුම්භ කෙරෙහි දැඩි බලපෑමක් සිදු කර ඇත...

**ජාතික දරිද්‍රතා රේඛාව (රුපියල්)**




**විදේශ විනිමය ද්‍රවශීලතා පීඩන මධ්‍යයේ අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල ඇති වූ හිඟයන් සැලකිය යුතු සමාජ බලපෑමක් ඇති කළේය**

*(ඖෂධ, ඉන්ධන, එල්.පී ගෑස්, ආහාර ද්‍රව්‍ය, කාර්මික අමුද්‍රව්‍ය ආදිය)*




**ආර්ථික අවපාතය මධ්‍යයේ බහුවිධ අංශයන්ගෙන් පැනනැගුණු ආර්ථික අවදානම් ඉහළ යෑම සමඟ දරිද්‍රතාවය තුරන් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රගතිය මන්දගාමී වී ඇත**




**ආර්ථික දුෂ්කරතා හේතුවෙන් මහජන නොසන්සුන්වීම් සහ දේශපාලන කැළඹීම් ඇති විය**

විශ්වසනීය සහ විනිවිදභාවයෙන් යුතු
ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මගින්
අර්බුදය තවදුරටත් උග්‍ර වීම වැළැක්වූ අතර
සමාජ-ආර්ථික ස්ථායීතාව
නැවත ස්ථාපිත කිරීමට සහාය විය...

**උද්ධමන අපේක්ෂා පාලනය කිරීම** ඉලක්ක කරගත් ශක්තිමත් සන්නිවේදන උපාය මාර්ගයක් අනුගමනය කරමින්, ඉල්ලුම් පීඩන මැඩපැවැත්වීම සඳහා මහ බැංකුව 2022 වසරේ අප්‍රේල් මාසයේ දී **සැලකිය යුතු ලෙස** මුදල් ප්‍රතිපත්තිය දැඩි කළ අතර, අවම මට්ටමක පැවති භාවිත කළ හැකි නිල සංචිත ප්‍රමාණය හමුවේ විනිමය අනුපාතිකය **ස්ථායී කිරීමට** සහ මූල්‍ය පද්ධතියේ **ස්ථායීතාව සුරක්ෂිත කිරීමට** ක්‍රියාමාර්ග ගත්තේය...

# උද්ධමන පීඩන වැඩි වීමත් සමග ආර්ථික සහ මිල ස්ථායීතාවය සහතික කිරීම සඳහා කඩිනම් සහ සැලකිය යුතු ප්‍රතිපත්තිමය මැදිහත්වීමක් අවශ්‍ය විය...





**විශාල ලෙස මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම සහ එය අඛණ්ඩව පවත්වාගෙන යෑමේ අවශ්‍යතාව:**

- ඉහළ යන උද්ධමන පීඩන සහ එමගින් දේශීය ආර්ථික ස්ථායීතාවයට වන අහිතකර බලපෑම පාලනය කිරීම
- වසංගතය පැවති කාලය තුළ අනුගමනය කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වල පසු බලපෑම පාලනය කිරීම
- අහිතකර උද්ධමන අපේක්ෂා ඉහළ යෑම පාලනය කිරීම
- සෘණ මූර්ත පොලී අනුපාතික මට්ටම අඩු කිරීම
- විදේශීය අංශයේ අසමතුලිතතා සමනය කිරීම
- පොලී අනුපාතික ව්‍යුහයේ පැවති විෂමතා නිවැරදි කිරීම

# 2021 අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මක වූ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය 2022 වසරේ මුල් කාලයේ සිට තවදුරටත් දැඩි කරන ලදී...

- ප්‍රතිපත්ති පොලී අනුපාතික:
  - **950 පදනම් අංක** ↑ *(2022)*
  - **100 පදනම් අංක** ↑ *(2023 වසරේ මේ දක්වා)*
- ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය:
  - **2 ප්‍රතිශතාංක** ↑ *(2021 සැප්තැම්බර්)*
- පොලී අනුපාතික මත පැනවූ උපරිම සීමා ඉවත් කරන ලදී

**නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය**





(අ) අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ අක්‍රීයව පැවති දින සඳහා බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයන් වාර්තා නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

# දැඩි මුදල් ප්‍රතිපත්තියට ප්‍රතිචාර දක්වමින්, වෙළඳපොළ පොලී අනුපාතික මාස කිහිපයක් තුළ සැලකිය යුතු ලෙස ඉහළ ගියේය...

## තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම





**ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නැංවීමට අමතරව, වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ යෑම සඳහා හේතු වූයේ:**

1. ඉහළ අවදානම් හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ඉහළ යෑම
2. දේශීය මුදල් වෙළඳපොළ තුළ විශාල හිඟ ද්‍රවශීලතාවක් අඛණ්ඩව පැවතීම

කෙසේ වෙතත්, ඉතා ඉහළ මට්ටමක පැවති වෙළඳපොළ පොලී අනුපාතික ක්‍රමයෙන් අඩුවෙමින් පවතී...

# දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට සහාය වෙමින්, දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව සෘණ මට්ටම්වල පැවතීමට ඉඩ සලසන ලදී...

**දේශීය මුදල් වෙළඳපොළ රුපියල් ද්‍රවශීලතාව සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (අ)**




(අ) අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ අක්‍රියව පැවති දින සඳහා බරිත සාමාන්‍යය ඒක්ෂණ මුදල් අනුපාතිකයන් වාර්තා නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ඉහළ උද්ධමන අනුපාතික මධ්‍යයේ දැඩි මුදල් තත්ත්වයන් පවත්වාගෙන යාමේ අවශ්‍යතාව**


... මහ බැංකුව මුදල් සහ මූල්‍ය ස්ථායීතාවය සහතික කිරීම සඳහා සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන ද්‍රවශීලතා කළමනාකරණ උපකරණ භාවිතා කළේය...

- වෙළඳපොළ වෙත විශාල ප්‍රමාණයකින් මැදිහත් වීම
- නිත්‍ය පහසුකම් භාවිතයට සීමා පැනවීම
  (නිත්‍ය තැන්පතු පහසුකම: < මාසයකට අවස්ථා 5ක්,
  නිත්‍ය ණය පහසුකම: < ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයෙන් 90%)
- කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි
- ද්‍රවශීලතා ආධාරක පහසුකම හඳුන්වා දීම
- හදිසි තත්ත්වයන් සඳහා වූ ද්‍රවශීලතා ආධාරක පහසුකම ශක්තිමත් කිරීම

# විවිධ පැතිකඩ ආවරණය කරමින් ගන්නා ලද ක්‍රියාමාර්ග හේතුවෙන් ගෙවුම් තුලනය මත පැවති පීඩනය පාලනය විය...

ඉහළ යන ආනයන වියදම් නිසා වෙළඳ හිඟය පුළුල් වීම හේතුවෙන්, විදේශ විනිමය ලැබීම්වල පැවති හිඟය හමුවේ ආනයන සීමා කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු විය

## ආනයන, අපනයන සහ වෙළඳ ශේෂය




පරිවර්තන සහතික කිරීම සඳහා අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතියක් හඳුන්වා දීම

මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම

### ආනයන සඳහා ඇතැම් ගෙවීම් ක්‍රම සීමා කිරීම

(2022 මැයි මාසයේ දී)

- විවෘත ගිණුම්
- භාණ්ඩ විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ ක්‍රමය
- පිළිගැනීම මත ලේඛන
- ගෙවීම මත ලේඛන

### ආන්තික තැන්පතු අවශ්‍යතාව හඳුන්වා දීම

- 2022 මැයි මාසයේ දී අයිතම 779
- 2023 පෙබරවාරි මාසයේ දී අයිතම 64

### තෝරා ගත් ආනයන තාවකාලිකව අත්හිටුවීම

- 2022 අගෝස්තු මාසයේ දී තාවකාලික අත්හිටුවීම (සංයෝජිත වර්ගීකරණ කේත 1,400ක්)
- 2022 සැප්.-නොවැ. කාලපරිච්ඡේදයේ දී තාවකාලික සිදු කළ අත්හිටුවීම් ලිහිල් කිරීම ආරම්භ කිරීම
- ඒකාබද්ධ තාවකාලික අත්හිටුවීම (සංයෝජිත වර්ගීකරණ කේත 1,220ක්)

# සංක්‍රමණික ශ්‍රමිකයන්ට දිරි දීමනා යෝජනා ක්‍රම කිහිපයක් හඳුන්වා දෙමින් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ නැංවීමට ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ද ගන්නා ලදී...

| | |
|---|---|
| **අතිරේක දිරිගැන්වීමේ යෝජනා ක්‍රම** | • "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් සඳහා අමතර දිරි දීමනා යෝජනා ක්‍රමය" අඛණ්ඩව පවත්වාගෙන යාම |
| **ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණය කිරීම** | • සංක්‍රමණික සේවා නියුක්තිකයන් විසින් රු. 20,000ට වඩා වැඩි මුදලක් එවීමේ දී, සෑම ගනුදෙනුවක් වෙනුවෙන්ම දරනු ලබන පිරිවැය රු. 1,000ක් දක්වා ප්‍රතිපූරණය කිරීමේ යෝජනා ක්‍රමය |
| **ලංකා රෙමිට්** | • විධිමත් ප්‍රේෂණ මාර්ග භාවිතය දිරිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාතික ප්‍රේෂණ ජංගම යෙදුම වන "ලංකා රෙමිට්" දියත් කරන ලදී |
| **තීරුබදු සහන** | • සංක්‍රමණික ශ්‍රමිකයන් විධිමත් මාර්ග හරහා රටට එවන මුදල් ප්‍රමාණය මත පදනම්ව අතිරේක තීරුබදු සහනය සහ විදුලි වාහන ආනයන දීමනාව ලබා දීම |

# 2021 සහ 2022 වසරවල දී විදේශ විනිමය ගෙවීම් කළමනාකරණය සඳහා ප්‍රාග්ධන ප්‍රවාහ ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී...

| | |
|---|---|
| **ප්‍රතිමුඛ ආයෝජන ගිණුම්** | • ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා ප්‍රේෂණ ගෙවීම් සීමා කිරීම (දින දර්ශිත වර්ෂයක් සඳහා) |
| **ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්** | • ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ/සහ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රේෂණ ගෙවීම් සීමා කිරීම |
| **සංක්‍රමණික දීමනාව** | • සංක්‍රමණ දීමනාව යටතේ විදේශ විනිමය අරමුදල් ගලා යෑම සීමා කිරීම සහ පළමු වරට සංක්‍රමණ දීමනාව සඳහා ඉල්ලීම් කරන විගමනිකයන් සඳහා එම දීමනාව සීමා කිරීම |
| **තාවකාලික නේවාසික වීසා හිමියන්** | • වෙනත් රටක තාවකාලික නේවාසික වීසා ලබාගෙන ඇති ඕනෑම ශ්‍රී ලාංකිකයෙකු සඳහා විදේශ ප්‍රේෂණ/විදේශ විනිමය නිකුත් කිරීම සීමා කිරීම |

## ප්‍රේෂණ ගෙවීම්

**එ.ජ.ඩො. මිලියන 296 (2022)**

**එ.ජ.ඩො. මිලියන 270 (2021)**

එ.ජ.ඩො. මිලියන 910 (2020)

## සංචාරක ගෙවීම්

**එ.ජ.ඩො. මිලියන 244 (2022)**

**එ.ජ.ඩො. මිලියන 239 (2021)**

එ.ජ.ඩො. මිලියන 449 (2020)

# අත්‍යවශ්‍ය ආනයන මූල්‍යනය සඳහා විදේශ විනිමය සපයන අතරම නිල සංචිත ගොඩනඟා ගැනීමට පියවර ගන්නා ලද අතර, එමගින් මහජනයා මත පීඩනය අවම කිරීමට හැකි විය...

**මහ බැංකුවේ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීම්, විදේශ විනිමය ණය සේවාකරණය සහ දළ නිල සංචිත**

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2021 | 2022 (අ) |
|---|---|---|
| **මහ බැංකුව විසින් මිලදී ගැනීම** | **506** | **2,148** |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ආශ්‍රිත මිලදී ගැනීම් | 213 | 550 |
| අපනයන ආදායම් ආශ්‍රිත මිලදී ගැනීම් | 214 | 1,184 |
| වෙළඳපොළ ආශ්‍රිත මිලදී ගැනීම් | 79 | 68 |
| ඉන්ධන බිල්පත් මූල්‍යනය කිරීම | - | 68 |
| ගල් අඟුරු බිල්පත් මූල්‍යනය කිරීම | - | 278 |
| **මහ බැංකුවේ සැපයුම්** | **1,253** | **2,716** |
| **ශුද්ධ මිලදී ගැනීම්** | **-747** | **-568** |
| **විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම් (පොලිය + ණය ආපසු ගෙවීම්)** | **6,836** | **3,237** |
| රජය (ආ) | 6,354 | 3,077 |
| මහ බැංකුව | 481 | 160 |
| **දළ නිල සංචිත** | **3,139** | **1,898** |

(අ) තාවකාලික
(ආ) නේවාසිකයන් හා අනේවාසිකයන් වෙත සිදුකරන ලද විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම් ඇතුළත් වේ.


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**මෙම දුෂ්කර කාලය තුළ දී ශ්‍රී ලංකාවේ ද්වි පාර්ශ්වික සහ බහු පාර්ශ්වික හවුල්කරුවන්ගෙන් සැලකිය යුතු සහයෝගයක් ලැබුණි:**


- ඉන්ධන, පොහොර සහ ඖෂධ වැනි අත්‍යවශ්‍ය ආනයන සඳහා **ඉන්දියානු ණය පහසුකම්** කිහිපයක් සපයා ඇත
- චීනයෙන් ලැබුණු විදේශ විනිමය හුවමාරු පහසුකමට අමතරව ඉන්දියාවේ සහ බංග්ලාදේශයේ මහ බැංකු සමඟ ඇති කරගත් ද්විපාර්ශ්වික **ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම්** මගින් සංචිත සඳහා දායකත්වය සැපයිණි
- ඉන්දියාවෙන් ලද **ආසියානු නිෂ්කාශන සංගමයේ** පහසුකමින් ලද ලැබීම් ද ණය සේවාකරණය සහ ආනයන මූල්‍යන කටයුතු සඳහා භාවිතයට ගන්නා ලදී
- **ලෝක බැංකුව** සහ **ආසියානු සංවර්ධන බැංකුව** අඛණ්ඩව මූල්‍ය ආධාර ලබා දුන්නේය

# විනිමය අනුපාතිකය ස්ථාවර කිරීම සඳහා මහ බැංකුව විසින් වෙළඳපොළ මාර්ගෝපදේශ සැපයීම ආරම්භ කරන ලදී...


## මාර්ගෝපදේශ පරාසය හඳුන්වා දීමෙන් පසු විනිමය අනුපාතිකය




## මාර්ගෝපදේශ පරාසය තුළ ස්ථාවර වූ විනිමය අනුපාතිකය...




## සඵල විනිමය අනුපාතික දර්ශක (2017=100) මුදල් වර්ග 24 පැස අනුව




**අපනයන මත බලපෑම**

- මුදලේ අගය අවප්‍රමාණය වීම අපනයනවල තරගකාරීත්වයට සහාය විය

**ආනයන මත බලපෑම**

- අත්‍යවශ්‍ය නොවන ආනයන අධෛර්යමත් විය

# බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීමට රෙගුලාසි නිකුත් කිරීම සහ අධීක්ෂණ ප්‍රවේශය ශක්තිමත් කිරීම ඇතුළු විචක්ෂණශීලී ප්‍රතිපත්තිමය මැදිහත්වීම් කිහිපයක් සිදු කරන ලදී...

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ඇතුළු ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙන ලදී :

- ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂකය (Capital Conservation Buffer) භාවිතා කිරීමට අවසර ලබා දීම
- අවම ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාතය (NSFR) සඳහා වන අවම නියාමන අවශ්‍යතා අඩු කිරීම
- රාජ්‍ය සුරැකුම්පත්වලට අදාළව වෙළඳපොළ මිල මත ලකුණු කළ අලාභය වසර දෙකක කාලයක් තුළ ගැළපීමට අවසර ලබා දීම
- අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමට සහ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීමේ ක්‍රියාවලියට අදාළ වාර්තා භාර දීම සඳහා නියමිත කාලසීමාවන් දීර්ඝ කිරීම
- අභිමතානුරූපී ගෙවීම් සීමා කිරීම

මැදි කාලීනව ශක්තිමත් සහ ස්ථාවර බලපත්‍රලාභී මුදල් සමාගම් ස්ථාපිත කිරීම අරමුණ ඇතිව බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ වැඩපිළිවෙල (ඒකාබද්ධකරණ වැඩපිළිවෙල) ක්‍රියාත්මක කෙරෙමින් පවතී.

අඛණ්ඩව පැවති අහිතකර ව්‍යාපාරික තත්ත්ව හේතුවෙන් පීඩාවට පත් වූ පුද්ගලයන් සහ ඇතැම් අංශවල ව්‍යාපාර වෙනුවෙන් ලබා දෙන ලද ණය පමා කාලයන් සහ ණය සහන සඳහා දීර්ඝ කිරීම් කිහිපයක් ලබා දෙන ලදී.

**ණයවල ගුණාත්මකභාවය අඛණ්ඩව පහළ යෑම, ද්‍රවශීලතාව මත ඇති වූ උග්‍ර පීඩනය, ඉහළ ණය හානිකරණය හේතුවෙන් ලාභදායීත්වය අඩු මට්ටමක පැවතීම සහ අනපේක්ෂිත අලාභ අවශෝෂණය කර ගැනීමට ප්‍රාග්ධන ස්වාරක්ෂක පිරිහීම හේතුවෙන් පැන නගින අභියෝග මධ්‍යයේ වුවද 2022 වසර තුළ දී බැංකු අංශයේ ස්ථායීතාව පවත්වා ගැනීමට හැකි විය.**

2022 වසරේ දී රාජ්‍ය මූල්‍ය අංශයේ පැවති **පීඩනය දැඩි වීමත්** සමඟ, නැවත **විශ්වාසය දිනා ගැනීම** සහ **ස්ථාවරත්වය ළඟා කරගැනීම** අරමුණු කරගෙන පෙර නොවූ මට්ටමේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියේ **ආරම්භයේ දී ම** ක්‍රියාත්මක කිරීමට රජයට සිදු විය....

2022 වසර මුල දී **ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ** සහාය පැතීමට පියවර ගැනීම රජය ආරම්භ කළ අතර....

2022 වසරේ අප්‍රේල් මස මැද භාගයේ දී **තෝරාගත් විදේශීය ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවන බව** ප්‍රකාශයට පත් කළේය...

# ආදායම වැඩි කිරීම ප්‍රධාන වශයෙන් පදනම් කරගත්, ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ගමන් මගකට රජය අවතීර්ණ විය...


## ආදායම වැඩි කිරීම

- එකතු කළ අගය මත බදු අනුපාතිකය සංශෝධනය කිරීම/ ඉහළ දැමීම
- එක් වරක් පමණක් අය කෙරෙන 25%ක අධිභාර බද්ද
- විදුලි සංදේශ බද්ද 15% දක්වා ඉහළ දැමීම
- සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් පැනවීම (පිරිවැටුම මත 2.5%)
- බදු පදනම පුළුල් කිරීම
- ආයතන සහ පුද්ගලයන් සඳහා වන බදු ව්‍යුහය සංශෝධනය කිරීම
- රඳවා ගැනීමේ බද්ද නැවත හඳුන්වා දීම
- එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම් ඉවත් කිරීම
- පෙට්‍රල්, ඩීසල්, දුම්වැටි සහ මද්‍යසාර මතවන නිෂ්පාදන බදු/ සුරා බදු සංශෝධනය කිරීම

## වියදම් තාර්කීකරණය

- විදුලිබලය සහ ඉන්ධන භාවිතය අවම කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම
- හදිසි නොවන/අත්‍යවශ්‍ය නොවන වියදම් සීමා කිරීම සඳහා රාජ්‍ය අංශය වෙත මාර්ගෝපදේශ නිකුත් කිරීම
- 2023 වසර සඳහා සියලුම රාජ්‍ය ආයතනවල අනුමත පුනරාවර්තන වියදම් ඇස්තමේන්තුවලින් 6% අඩු කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත
- රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායයන් සඳහා වන ප්‍රතිසංස්කරණ (ලං.ඛ.නී.සං./ලං.වි.ම.)
- පිරිවැය පිළිබිඹු වන මිල සූත්‍රය
- රජය සතු ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණ ඒකකය
- ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම

**මෙම පියවර සැලකිල්ලට ගනිමින්, 2022 අතුරු අයවැය මගින් 2022 සඳහා වන රාජ්‍ය මූල්‍ය ඉලක්ක සංශෝධනය කෙරිණි**




# 2022 අප්‍රේල් 12 වන දින සිට තෝරාගත් විදේශ ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවන බව රජය නිවේදනය කළ අතර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් ආරම්භ කළේය...

## ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම පහළ දැමීම්

| | එස් සහ පී (S&P) | ෆිච් (Fitch) | මූඩීස් (Moody's) |
|---|---|---|---|
| 2019 අවසානයේ දී | B(S) | B (N) | B2(S) |
| 2020 අවසානයේ දී | CCC(+)(S) | CCC | Caa1(S) |
| 2021 අවසානයේ දී | CCC+(N) | CC | Caa2(S) |
| 2022 අවසානයේ දී | SD | RD | Ca(S) |

- ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම් හේතුවෙන් විදේශීය ණය සේවාකරණය සඳහා අවශ්‍ය විදේශ මූල්‍යන සපයා ගැනීම රජයට ප්‍රබල අභියෝගයක් විය

- විදේශීය මූල්‍යනයට ඇති ප්‍රවේශය සීමා වීම සහ භාවිත කළ හැකි නිල සංචිත 2022 වසරේ මුල් කාලය තුළ දී අවම අගයකට ආසන්න වීම, රජයේ විදේශීය ණය සේවාකරණය සඳහා ගැටලු ඇති කළේය





**2022 වසරේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා වන කාලය තුළ දී ද්විපාර්ශ්වික සහ වාණිජ ණය ආපසු ගෙවීම තාවකාලිකව අත්හිටුවීම ඔස්සේ විදේශ විනිමය ගෙවීම්වල ඇස්තමේන්තුගත ඉතිරිය එ.ජ. ඩොලර් බිලියන 2.8කි.**

# විදුලිබල සහ බලශක්ති අංශයේ උත්සන්න වූ අවදානම් හේතුවෙන් ක්ෂණික හා තීරණාත්මක ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමට සිදුවිය...

- 2022 ජනවාරි මාසයේ සිට ලං.ඛ.නී.සං. විසින් ගෝලීය මිල ගණන්වල විචලනයන්ට අනුකූලව දේශීය ඛනිජ තෙල් නිෂ්පාදිතවල මිල ගණන් අවස්ථා ගණනාවක දී **ඉහළ දමමින්** සංශෝධනය කරන ලදී...

**දේශීය ඛනිජ තෙල් මිල සංශෝධන**
**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**





*මූලය* : ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

- **රජය සතු ව්‍යවසායයන්ගේ මූල්‍ය ශක්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා තවත් පියවර ගන්නා ලදී**
  - ලං.ඛ.නී.සං.හි මූල්‍ය ශක්‍යතාව වැඩිදියුණු කිරීමේ පියවරක් ලෙස, රජය විසින් සහතික කරන ලද **එ.ජ. ඩොලර් බිලියන 2.5ක් වූ** ලං.ඛ.නී.සං.හි විදේශ විනිමය ණය තොගය **රජයේ ශේෂ පත්‍රය යටතට පවරන ලදී**
  - තවද, **ලං.වි.ම. රුපියල් බිලියන 146.6ක ණය වගකීම් රාජ්‍ය ණය වගකීම් යටතට පවරන ලදී**


මානව සම්බන්ධීකරණය වූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් අපේක්ෂිත **ප්‍රතිඵල** අත්කර දී ඇති අතර, විදේශීය මූල්‍ය ආයතනවල සහාය ලැබීම ආරම්භ වීමට පෙර යම් **ස්ථායී සමතුලිතයකට** ළඟාවීම සඳහා ද එම ප්‍රයත්නයන් උපකාරී විය.

# නිවැරදි කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිරිවැය අධික හා වේදනාකාරී වූ නමුත්, එවැනි ප්‍රතිපත්ති නොමැති වුවහොත් අර්බුදය තවත් උග්‍ර විය හැකි අතර, එමගින් පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට සිදුවන අපහසුතා දීර්ඝ කාලීනව පැවතිය හැකිය...



# උද්ධමනය වේගවත් නිර්-උද්ධමන ක්‍රියාවලියකට අවතීර්ණ විය...

## මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය)[අ]




(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2023 පෙබරවාරි මාසයේ සිට කො.පා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලද අතර පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ කො.පා.මි.ද. ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී. ඒ අනුව 2023 ජනවාරි මාසයේ සිට රූප සටහනේ දක්වා ඇති දත්ත නව පදනම් වර්ෂය වන 2021=100 මත පදනම් වේ.

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*


**මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම තුළින් ඇති වූ පසු බලපෑම්** හේතුවෙන් **සමස්ත ඉල්ලුම් පීඩන අඩු වීම මෙන්ම ආහාර සහ බලශක්ති උද්ධමනය පහළ යෑම** හේතුවෙන් 2022 වසරේ අවසාන කාලයේ සිට මතුපිට උද්ධමනය පහළ ගියේය....

| වාර්ෂික ලක්ෂ්‍යමය (කො.පා.මි.ද.) | 2021 දෙසැ. | 2022 සැප්. | 2023 අප්‍රේ. |
|---|---|---|---|
| මතුපිට | 12.1% | 69.8% | 35.3% |
| මූලික | 8.3% | 50.2% | 27.8% |
| ආහාර | 22.1% | 94.9% | 30.6% |
| ආහාර නොවන | 7.5% | 57.6% | 37.6% |

## ඉහළ පොලී අනුපාතික වාතාවරණය මගින්, උද්ධමනය පාලනය කිරීමට අවශ්‍ය වූ පෞද්ගලික අංශයට ලබා දුන් ණය සහ රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය ප්‍රසාරණය මන්දගාමී කළේය...

## කෙසේ වෙතත්, ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම සහ අවදානම් අධිමිල ඉහළ යෑම හේතුවෙන් රජයේ මුදල් ප්‍රවාහ කෙරෙහි සිදු වූ බලපෑමෙන් බැංකු පද්ධතිය මගින් රජයට ලබා දුන් ශුද්ධ ණය ඉහළ මට්ටමක පැවතුණි...


### දේශීය ණයෙහි මාසික වෙනස් වීම (අ)




(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.


## දේශීය ණයෙහි වාර්ෂික වෙනස

### 2022 වසර තුළ



# රජයට ලබා දුන් ශුද්ධ ණය ඉහළ මට්ටමක පැවතීම මධ්‍යයේ වුවද, පෞද්ගලික අංශයට ලබා දුන් ණය සැලකිය යුතු ලෙස සංකෝචනය වීම සහ බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් පහළ යෑම හේතුවෙන් මුදල් ප්‍රසාරණය මන්දගාමී විය...


**පුළුල් මුදල්වල ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස සඳහා තුඩු දුන් සාධක - (වත්කම් අනුව)(අ)**




(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**මුදල් සමස්තවල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (අ)**




(අ) 2022 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම එම කාලය තුළ මුදල් හා ණය සමස්ත ඉහළ නැංවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය | 2021 වසර අවසානයේදී | 2022 අප්‍රේල් | 2022 වසර අවසානයේදී |
|---|---|---|---|
| පුළුල් මුදල් ($M_{2b}$) | 13.2% | 20.0% | 15.4% |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය | 13.1% | 20.3% | 6.2% |

# වෙළඳ හිඟයෙහි සැලකිය යුතු පහළ යෑමත් සමඟ විදේශ විනිමය පීඩනය සැලකිය යුතු ලෙස අඩු විය...

## ආනයන වියදම් අඩු විය


### ආනයන




| ආනයන කාණ්ඩ | වටිනාකම (එ.ජ.ඩොලර් මිලියන) | | වර්ධනය % |
|---|---|---|---|
| | 2021 | 2022 | |
| **පාරිභෝගික භාණ්ඩ** | **3,848.7** | **2,813.0** | **-26.9** |
| ආහාර හා පාන වර්ග | 1,666.5 | 1,607.9 | -3.5 |
| ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ | 2,182.2 | 1,205.1 | -44.8 |
| අන්තර් භාණ්ඩ | 12,308.9 | 12,438.8 | 1.1 |
| **ආයෝජන භාණ්ඩ** | **4,462.7** | **3,030.5** | **-32.1** |
| **මුළු ආනයන** | **20,637.4** | **18,291.0** | **-11.4** |

## අපනයන ආදායම යථා තත්ත්වයට පත් විය


### අපනයන




| අපනයන කාණ්ඩ | වටිනාකම (එ.ජ.ඩොලර් මිලියන) | | වර්ධනය % |
|---|---|---|---|
| | 2021 | 2022 | |
| **කාර්මික භාණ්ඩ** | **9,702.0** | **10,465.3** | **7.9** |
| කෘෂිකාර්මික භාණ්ඩ | 2,729.5 | 2,568.0 | -5.9 |
| ඛනිජමය භාණ්ඩ | 44.5 | 50.0 | 12.3 |
| **මුළු අපනයන** | **12,498.6** | **13,106.4** | **4.9** |

## වෙළඳ හිඟය අඩු මට්ටමක පැවතුණි

### වෙළඳ ශේෂය



# විස්තීර්ණ ණය පහසුකම සඳහා ජා.මු. අරමුදලේ අනුමැතිය ලැබීම ආර්ථිකය පිළිබඳ විශ්වාසය ශක්තිමත් කර ඇත...

| | |
|---|---|
| **නිලධාරී මට්ටමේ එකඟතාව** | **2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී** නිලධාරී මට්ටමේ එකඟතාවට එළඹුණි |
| **ජා.මු. අරමුදලේ විධායක මණ්ඩලයේ අනුමැතිය සහ පළමු වාරිකය** | නිල ණය හිමියන්ගෙන් මූල්‍ය සහතිකවීම් ලබා ගැනීමෙන් පසු **2023 වසරේ මාර්තු මාසයේ දී** විස්තීර්ණ ණය පහසුකම අනුමත විය |
| **බහු පාර්ශ්වීය ණය හිමියන්ගෙන් ලද මූල්‍යමය සහාය** | **ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව** 2023 වසරේ දී සුවිශේෂී මූල්‍ය ආධාර ලෙස **එ.ජ.ඩො. බිලියන 1.5කට** වඩා ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ |
| **ආයෝජකයන්ගේ විශ්වාසය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම** | රජයේ සුරැකුම්පත් වෙළඳපොළට සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙත ක්‍රමයෙන් මූල්‍ය ගලා ඒම සිදු වීමත් සමඟ **ආයෝජකයන්ගේ විශ්වාසය වැඩි දියුණු විය** |

**ජා.මු. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමින් අනුමත වූ සමස්ත මුදල**

**වි.ගැ.හි. බිලියන 2.3**

දළ වශයෙන් එ.ජ.ඩො. බිලියන 3

**පූර්ව ක්‍රියාමාර්ග**

09


| ව්‍යුහාත්මක මිනුම්දඬු | ප්‍රමාණාත්මක කාර්යසාධන නිර්ණායක |
|---|---|
| 18 | 04 |
| **දර්ශක ඉලක්ක** | **මුදල් ප්‍රතිපත්ති උපදේශන වගන්තිය** |
| 04 | 01 |

# විනිමය අනුපාතිකය වෙළඳපොළ බලවේග විසින් තීරණය කිරීමට ඉඩ ලබා දෙන ලද අතර, දළ නිල සංචිත අඛණ්ඩව ඉහළ යමින් පවතී...

## දළ නිල සංචිත




## එ.ජ.ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි එතැන් විනිමය අනුපාතිකයේ වෙනස්වීම




**2023 වසරේ ගෙවුම් තුලනය සඳහා මූල්‍ය ලැබීම්**

**රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම්**

**එ.ජ.ඩො. මිලියන 250 පමණ**
2023 ජන.-අප්‍රේ.

**ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කළ ශුද්ධ මිලදී ගැනීම්**


**එ.ජ.ඩො. බිලියන 1.1 පමණ**
2023 ජන.-අප්‍රේ.

**ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි පළමු වාරිකය**

**එ.ජ.ඩො. මිලියන 333 පමණ**
2023 මාර්තු මස


# විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සංචාරක ඉපැයීම්වල ඉහළ යෑමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කෙරේ...

## විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ




**2022 පෙබරවාරි මාසයේ දී එ.ජ.ඩො. මිලියන 205ක්** ලෙස වාර්තා වූ **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2023 මාර්තු මාසය වන විට එ.ජ.ඩො. මිලියන 568ක් දක්වා ඉහළ ගියේය**


## සංචාරක ඉපැයීම්




**2022 වසරේ දී සංචාරක පැමිණීම්වල මාසික සාමාන්‍යය 60,000ක්** පමණ වූ අතර, ඊට සාපේක්ෂව **2023 වසරේ** මේ වන විට වාර්තා වී ඇති **සංචාරක පැමිණීම්වල මාසික සාමාන්‍යය 110,000ක් පමණ වේ**

# රාජ්‍ය මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වයේ පිරිහීම පාලනය කිරීම සඳහා ප්‍රතිපත්තිමය පියවර උපකාරී විය...


## ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශක (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)




- **2022 වසරේ දී සියලුම ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස) යහපත් අතට වර්ධනය විය:**

| වර්තන ගිණුමේ ශේෂය | ප්‍රාථමික හිඟය | සමස්ත අයවැය හිඟය |
|---|---|---|
| (6.4%) ▼ | (3.7%) ▼ | (10.2%) ▼ |
| 2021: (7.3%) | 2021: (5.7%) | 2021: (11.7%) |

## මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම් (ද.දේ.නියෙහි % ලෙස)




- **ණය සේවාකරණ ගෙවීම් අත්හිටුවීම මගින් සැලකිය යුතු ප්‍රමාණයක විදේශ විනිමය ගෙවීම් ඉතිරි කර ගැනීමට හැකියාව ලැබුණු අතර, ගෙවුම් තුලන අර්බුදය හමුවේ එමගින් තාවකාලික සහනයක් සැලසිණි**

| දේශීය ණය සේවාකරණ ගෙවීම් (රුපියල් බිලියන) | විදේශීය ණය සේවාකරණ ගෙවීම් (රුපියල් බිලියන) |
|---|---|
| 2,510 ▲ | 487 ▼ |
| 2021: 1,594 | 2021: 786 |


# දීර්ඝ කාලීනව ප්‍රමාද වූ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සමඟ උපයෝගීතා සැපයීම් සඳහා පිරිවැය පිළිබිඹුවන මිලකරණ ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීම ආරම්භ කිරීම, රජය සතු ප්‍රධාන ව්‍යවසායයන්ගේ මූල්‍ය ශක්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා සහාය විය...

මිල සංශෝධන සහ විනිමය අනුපාතික ක්‍රමානුකූලව ස්ථාවර වීම සමඟ ලං.ඛ.නී.සං. **2022 වසරේ ජූලි මාසයේ සිට මාසික පදනම මත ලාභයක් (බදුවලට පෙර) වාර්තා කළේය**

විදුලි ගාස්තු සංශෝධනයන් සමඟ මුදල් ප්‍රවාහය වර්ධනය වීම කිසියම් දුරකට හේතුකොට ගෙන 2022 වසරේ අගෝස්තු මාසයේ සිට **ලං.වි.ම.හි මෙහෙයුම් අලාභය තරමක් දුරට පහළ ගොස් ඇත**

***හඳුනාගත් වගකීම් රාජ්‍ය ණය වගකීම් යටතට පැවරීමත් සමඟ ලං.වි.ම.හි සහ ලං.ඛ.නී.සං.හි දිගුකාලීන ණය බර යම්තාක් දුරකට ලිහිල් වී ඇත...***

**ලං.ඛ.නී.සං.**
**විදේශ මුදලින් නාමනය කරන ලද ණය ප්‍රමාණය සහ ආනයන බිල්පත්**




**ලං.වි.ම.**
**දිගු කාලීන වගකීම්**




**ඛනිජ තෙල් අංශයේ ප්‍රතිසංස්කරණ:**

- **පිරිවැය පිළිඹිබු කෙරෙන මිල සූත්‍රය** හඳුන්වා දීම
- **ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන)** පනත බලාත්මක කිරීම
- **තරඟකාරී** දේශීය ඛනිජ තෙල් වෙළඳපොළ

**විදුලිබල අංශයේ ප්‍රතිසංස්කරණ:**

- ලං.වි.ම. ප්‍රතිව්‍යුහගත කිරීමට **අවශ්‍ය පහසුකම් සැලසීම**
- **2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත 2022 ජූනි මාසයේ දී සංශෝධනය කිරීම.**
- පිරිවැය ආවරණය කෙරෙන **විදුලි ගාස්තු ගැළපුම් ක්‍රමවේදයක්** අර්ධ වාර්ෂික පදනමින් ක්‍රියාත්මක කිරීම

# අවදානමට ලක්විය හැකි ගෘහ ඒකකවල සමාජ ආර්ථික යහපැවැත්ම ඉහළ නැංවීමේ අරමුණින් රජය පවත්නා ආරක්ෂණ ජාල වැඩසටහන් ශක්තිමත් කිරීමට කටයුතු කළේය...

**සමෘද්ධි වැඩසටහනේ පවුල් ඒකක දීමනාව සංශෝධනය කිරීම**

| | |
|---|---|
| රු. 3,500.00 | රු. 4,500.00 |
| රු. 2,500.00 | රු. 3,200.00 |
| රු. 1,500.00 | රු. 1,900.00 |

**සමෘද්ධි සහනාධාර වැඩසටහනෙහි මූල්‍යාධාර ලබාදීම**
(ප්‍රතිලාභී පවුල් මිලියන 1.7ක් සහ වෙනත් ප්‍රතිලාභීන් ආවරණය කරයි)

**රුපියල් බිලියන 120**

**2022 පෙබරවාරි මාසයේ සිට ප්‍රතිලාභී පවුලක සමෘද්ධි දීමනාවෙහි සාමාන්‍ය වර්ධනය**

**28%**

**හදිසි මූල්‍යාධාර වැඩසටහන**
**රු. 3,000 - රු. 5,000**

(සමෘද්ධි ප්‍රතිලාභීන් හා සමෘද්ධි වැඩසටහන යටතේ පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් සහ වැඩිහිටි, ආබාධිත සහ වකුගඩු රෝගවලින් පෙළෙන්නන් සඳහා වූ සහනාධාර)

| | |
|---|---|
| රු. බි. 38.5 | රු. බි. 45.5 |
| (ලෝක බැංකුව) | (ආසියානු සංවර්ධන බැංකුව) |

**"කිසිවෙකු අත්හැරෙන්න දෙන්න එපා" වැඩසටහන යටතේ සමාජ ප්‍රතිලාභ ලේඛනයක් සැකසීම කඩිනම් කිරීම**

*මේ යටතේ සැලසුම් කර ඇති පියවර*
- *සුබසාධන ප්‍රතිලාභ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම*
- *ඒකාබද්ධ සුභසාධන කළමනාකරණ පද්ධතියක් සකස් කිරීම*

# මැදි කාලීන පෙර දැක්ම


මෙහි ඉදිරිපත් කර ඇති මැදි කාලීන සාර්ව ආර්ථික රාමුව, 2023 සැප්තැම්බර් මාසය අවසන් වීමට පෙර **ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය** සම්පූර්ණ කිරීම ඇතුළුව, **ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දක්වන වැඩසටහන** සාර්ථකව ඉදිරියට ගෙන යෑමේ සහ එමගින් ජාත්‍යන්තර මූල්‍ය ආයතනවලින් තවදුරටත් මූල්‍ය සහාය ලැබීමේ උපකල්පනය ඇතුළත් **ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළ** මත පදනම් වී ඇත

# 2023 වසරේ දී උද්ධමනය ශීඝ්‍රයෙන් පහළ ගොස් මැදි කාලීනව අපේක්ෂිත ඉලක්කගත මට්ටම්වල ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ...

**මේ සඳහා පහත සඳහන් කරුණු සහාය වනු ඇත;**


- දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය තත්ත්ව හේතුවෙන් සමස්ත ඉල්ලුම අඩුවීම
- ගෝලීය හා දේශීය වශයෙන් ඇති වූ සැපයුම් අවහිරතා යථා තත්ත්වයට පත්වීම
- හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම

**උද්ධමනයෙහි ගතිකතාව සහ පදනම් බලපෑම (කො.පා.මි.ද., 2021=100)**




**පවතින ඉහළ උද්ධමනය 2023 වසර අවසාන භාගයේ දී තනි ඉලක්කමක මට්ටමට ගෙන ඒමට මහ බැංකුව කැපවී සිටී.**

**මතුපිට උද්ධමන පුරෝකථන**
**කො.පා.මි.ද.* (කාර්තුමය සාමාන්‍යය, වාර්ෂික ලක්ෂ්‍යමය, %)**





*මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන*

*...කෙසේ වෙතත්, **රාජ්‍ය මූල්‍ය හා විදේශීය ස්වාරක්ෂක තිරසාර ලෙස ශක්තිමත් කිරීමේ ප්‍රයත්න** සමඟින් **ජා. මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මගින් සහාය දැක්වෙන වැඩසටහන සාර්ථකව අඛණ්ඩව පවත්වාගෙන යෑම** මෙන්ම **ආර්ථික විභවයන් වැඩිදියුණු කිරීම සඳහා යෝජිත ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම** මැදි කාලීනව ආර්ථික හා මිල ස්ථායීතාව සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වනු ඇත...*


# 2022 වසරේ දී මුහුණ දුන් දරුණුතම ආර්ථික සංකෝචනයෙන් පසුව ශ්‍රී ලංකා ආර්ථිකය මැදි කාලීනව ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ...

- **සාර්ව ආර්ථික තත්ත්වයන් ස්ථාවර වීම මගින් කෙටි කාලයේ සිට මැදි කාලීනව ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම ශක්තිමත් කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එමගින් ආර්ථික වර්ධනයේ විභව මට්ටම සාක්ෂාත් කර ගැනීමට හැකිවේ**

## මූර්ත ද.දේ.නි. වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය)




## ආයෝජන සහ ඉතුරුම් (ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස)





**මැදි කාලීන වර්ධනය සඳහා පහසුකම් සලසනු ඇතැයි අපේක්ෂා කෙරෙන අංශ;**

- කොළඹ වරාය නගරය, කොළඹ බටහිර බහාලුම් පර්යන්තයට සහ හම්බන්තොට කාර්මික කලාපය ආදී කර්මාන්ත කලාප වෙත අපේක්ෂිත ණය නොවන මූල්‍ය ප්‍රවාහ ගලා ඒම්
- සංචාරක අංශයේ ආයෝජන
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ස්ථාපිත ආයෝජකයන් වෙත පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානය මගින් ද සෘජු විදේශීය ආයෝජන ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කෙරේ


# විදේශීය අංශයේ ඉදිරි දැක්ම ධනාත්මකව පවතින අතර, ජා. මූ. අරමුදලේ විස්තීරණ ණය පහසුකමෙහි දක්වා ඇති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම එම ගම්‍යතාවය පවත්වා ගැනීම සඳහා තීරණාත්මක වේ...

## අපනයන, ආනයන සහ වෙළෙඳ ශේෂය




අපනයන වර්ධනය මගින් ආනයන වර්ධනය අභිබවා යනු ඇතැයි අපේක්ෂා කරන බැවින් **වෙළෙඳ හිඟය මධ්‍ය කාලීනව අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ**


## විදේශීය ජංගම ගිණුමේ ශේෂය





**විදේශීය ජංගම ගිණුමේ හිඟය** මධ්‍ය කාලීනව තිරසාර පහළ මට්ටමකට **ක්‍රමයෙන් අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ**

# රාජ්‍ය මූල්‍ය අංශයේ ඉදිරි දැක්ම...

## රජයේ ආදායම සහ වියදම




## ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ





2022 සහ 2023 මුල් භාගයේ දී ක්‍රියාත්මක කරන ලද ආදායම් වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග නුදුරු කාලයේ දී සහ මැදි කාලයේ දී ප්‍රතිලාභ ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, රජයේ මැදි කාලීන ආදායම් ඉලක්ක ළඟා කර ගැනීම සඳහා **ආදායම් පරිපාලන ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම** අත්‍යවශ්‍ය වේ

**ඵලදායී නොවන පුනරාවර්තන වියදම් අවම කිරීම, රාජ්‍ය අංශයේ සේවක බඳවා ගැනීම් සීමා කිරීම, සමාජ ආරක්ෂණ ජාල වඩා ඉලක්කගත කිරීම සහ ප්‍රමුඛතා පදනමකින් යුතුව ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම** මැදි කාලයේ දී රජයේ වියදම අඩු කරගැනීම සඳහා අවශ්‍ය වේ

# ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව නිම කිරීම රාජ්‍ය ණය තිරසාර බව සහතික කිරීම සහ ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා ඉතා වැදගත් වේ...

**මධ්‍යම රජයේ ණය**




- දැනට ක්‍රියාත්මක වන ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණ කිරීම මගින් රජයේ ණය සේවාකරණ බරෙහි කැපී පෙනෙන අඩුවීමක් අපේක්ෂා කෙරෙන අතර, **2027-2032 කාලය තුළ දී වාර්ෂික දළ මූල්‍යන අවශ්‍යතාවල සාමාන්‍යය ද.දේ.නි.යෙන් 13%කට වඩා අඩු මට්ටමකට සීමා වේ යැයි අපේක්ෂිතය**

- **මධ්‍යම රජයේ විදේශීය ණය සේවාකරණ ගෙවීම්** 2027 සිට 2032 දක්වා යන කාලයේ දී සෑම වසරක් තුළම **ද.දේ.නි.යෙන් 4.5%කට වඩා අඩුවෙන් පවත්වා ගැනීම රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම මගින් අපේක්ෂා කෙරේ**

- 2032 වසර වන විට **නොපියවූ රාජ්‍ය ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 95%*කට වඩා අඩු කිරීමට අපේක්ෂා කෙරේ**

** ජා.මූ.අ. ණය පරිමිතීන්ට අනුව ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය මනිනු ලැබිණි.*

# ගැටලු සහ ප්‍රතිපත්ති

- දශක කිහිපයකට පෙර සංවර්ධනය වෙමින් පැවති රටවල් අතරින් වඩාත් **ඉදිරියෙන් සිටි රාජ්‍යයක** මට්ටමේ සිට වර්තමානය වන විට අර්බුද රාශියකින් අත්මිදීම සඳහා **ප්‍රයත්න දරන** රටක් දක්වා ගමන් කළ කාලය තුළ දී තිරසාර සමාජ-ආර්ථික **ප්‍රගතිය** සහ **සෞභාග්‍යය** කරා ශ්‍රී ලංකාව මෙහෙයවීමට පැවති රජයන් අසමත් වී ඇත.

- නිදහසින් පසු බොහෝ ක්‍රියාමාර්ග ගනු ලැබුව ද, ශක්තිමත් සහ ස්ථාවර **ජාතික ප්‍රතිපත්ති රාමුවක්** නොමැතිකම හේතුවෙන් රට සංවර්ධනය වීමේ දුෂ්කරතාවලට මුහුණ දුන් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය දුර්වල වීම, දීර්ඝ කාලයක සිට පැවත එන ගැටලු පිළිඹිබු කරමින් **අඛණ්ඩ ද්විත්ව හිඟයක්** පැවතීම මෙන්ම, මන්දගාමී ලෙස ලෙස සිදුවන වෙනස්වීම්, අනුගතවීම් හා පරිවර්තනයවීම් හේතුවෙන් විශේෂයෙන් ම මෑත දශක කිහිපය තුළ දී ආර්ථික වර්ධන වේගය අඩාල වී කලාපයේ අනෙකුත් රටවල ආර්ථිකයන්ට සාපේක්ෂව පසුබෑමට ලක් විය.

- මෙම අභියෝග සහ දිගු කාලීන ගැටලු බොහොමයක් විසඳීම සඳහා **ප්‍රතිපත්ති සම්පාදකයින්** සහ **අදාළ බලධාරීන්** විසින් අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ රාශියක් කඩිනමින් **ක්‍රියාත්මක කිරීම** ඉතා වැදගත් වේ.

- විශේෂයෙන්ම, අර්බුදයක් මගින් ව්‍යුහාත්මක ගැටලු විසඳීම සඳහා වෙනස්කම් සිදු කිරීමට මෙන්ම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට **අවස්ථා** නිර්මාණය කරයි.




**දිගු කාලයක සිට ක්‍රියාත්මක කිරීමට ප්‍රමාද වූ ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම** සඳහා වන කැපවීම, මැදි කාලීනව සිට දිගු කාලීනව ආර්ථිකය හැඩගැස්වීමේ දී ඉතා වැදගත් වනු ඇත

පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගතකරණ කාල සීමාව තුළ විදේශීය ණය තිරසාරභාවය සඳහා **විදේශීය මූල්‍යනය ඵලදායී ලෙස යොදා ගැනීම ප්‍රමුඛතාවය කර ගැනීම සහ භාවිත කිරීම**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ දක්වා ඇති තිරසාර ණය ඉලක්කවලට අනුකූලව **ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම**

**පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය දීර්ඝ කාලයක් පුරා ප්‍රමාද වී ඇති ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ**

**ස්ථාවර බදු ප්‍රතිපත්ති නොමැතිකම** සහ අපේක්ෂිත ආදායම් ඉලක්ක සපුරා ගැනීම සඳහා **බදු පරිපාලනය සහ නීතිමය අනුකූලතා රාමුව වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව**

මැදි සහ දිගු කාලීනව **තිරසාර ලෙස මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කිරීම සඳහා වියදම් තාර්කිකකරණ උපායමාර්ග කාර්යක්ෂම කිරීමේ අවශ්‍යතාව**




**රටේ බලශක්ති අනාරක්ෂිතභාවය**

**රාජ්‍ය වියදම් කළමනාකරණයේ අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා ආයතනික සහ ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ**

අපනයන අංශයේ ප්‍රතිපත්ති මගින් භාණ්ඩ හා සේවාවල **නවීනත්වය වැඩිදියුණු කිරීම** කෙරෙහි අවධානය යොමු කළ යුතුය

**ජාතික වෙළඳ ප්‍රතිපත්තිය සැලකිය යුතු ආකාරයෙන් නැවත දිශානතිගත කිරීම** තුළින් අපනයන කරා වඩාත් කේන්ද්‍රගත වීම සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක ගැළපීම් කිරීම රටට අවශ්‍ය වේ.

පසුගිය දශක කිහිපය තුළ අඩු සෘජු විදේශ ආයෝජන සලකා බැලීමේදී, **වගකීම් පදනමකින් නොවන ආයෝජන ප්‍රවාහ ආකර්ෂණය කරගැනීම ආර්ථික පුනර්ජීවනය සඳහා ඉතා වැදගත් වේ**

සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා සංචාරක පැමිණීම් ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග සහ **සංචාරක ඉපැයීම් ග්‍රහණය කර ගැනීම** සඳහා විධිමත් ජාලයක් ඇති කිරීම අවශ්‍ය වේ




**වෘත්තිකයන් සහ පුහුණු ශ්‍රමිකයින් විශාල වශයෙන් සංක්‍රමණය වීම හේතුවෙන් ඵලදායීතාවයේ සැලකිය යුතු පහළ යෑමක් ඇති විය හැක**

සමස්ත ආර්ථික සංවර්ධනය සහ සුබසාධනය සඳහා **ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමේ** වැදගත්කම

**ආනයනික භාණ්ඩවල දේශීය මිල ගණන් පහළ යෑමෙහි පවතින ප්‍රමාදය** ජීවන වියදම පහත හෙළීමට බාධාකාරී විය හැකිය

**වඩාත් අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල සුබසාධනය සහතික කිරීම සඳහා ප්‍රතිපත්තිමය උපායමාර්ග නැවත සකස් කිරීමේ කඩිනම් අවශ්‍යතාව**

ශක්තිමත් ආර්ථික පුනර්ජීවනයක් සහ වර්ධනයක් සඳහා සහාය වීමට **ජාතික ප්‍රතිපත්ති සැලසුම් යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ සියලු පැතිකඩ ආවරණය වන පරිදි එම සැලසුම් ක්‍රියාත්මක කිරීම** වඩාත් ශක්තිමත්ව සිදු කළ යුතුය

මෑත වසරවල දී **රාජ්‍ය අංශය බැංකු පද්ධතිය මත අඛණ්ඩව රඳා පැවතීම**




ගෘහස්ථ කෘෂිකාර්මික අංශයේ ප්‍රතිපත්තිමය අස්ථාවරත්වය


දීර්ඝ කාලයක් මුළුල්ලේ ප්‍රමාද වූ වෙළඳපොළ ප්‍රතිසංස්කරණ

ආර්ථිකය ඩිජිටල්කරණය වේගවත් කිරීම ඉතා වැදගත් වේ

තිරසාර වර්ධනයක් සහතික කිරීම සඳහා පරිසරය සංරක්ෂණය කිරීම ඉතා වැදගත් වේ

අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කඩිනමින් සිදුකිරීම මත ආර්ථික වර්ධනයේ තිරසාරභාවය රඳා පවතී

1. ශ්‍රී ලංකාවේ නිර්-උද්ධමන (උද්ධමනය පහළ යෑමේ) ක්‍රියාවලිය
2. ශ්‍රී ලංකාවේ ආර්ථික ගැළපුම් වැඩසටහන සඳහා ආධාර වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ
3. ‘ශ්‍රී ලංකා මහ බැංකු පනතේ’ විශේෂ කරුණු
4. ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වර්ෂය 2015 ලෙස යාවත්කාලීන කිරීම
5. ආර්ථික අර්බුදය මධ්‍යයේ ශ්‍රී ලංකාවේ ළමා මන්දපෝෂණය තුරන් කරලීම
6. පාරිභෝගික මිල දර්ශකයන්ගේ පදනම් වර්ෂ 2021 ලෙස යාවත්කාලීන කිරීම
7. අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම සහ පරිවර්තනය අධීක්ෂණය කිරීම
8. විදේශීය අංශයේ තුලනය ශක්තිමත් කිරීම සඳහා පශ්චාත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා
9. පද්ධතිමය මූල්‍ය අර්බුද වළක්වාලීමේ සහ බැංකු අංශය තුළ මහජන විශ්වාසය යළි පිහිටුවීමෙහිලා මහ බැංකු සතු කාර්යභාරය
10. ශ්‍රී ලංකාව තුළ සාර්ව විචක්ෂණ අධිකාරියක් පිහිටුවීම
11. මුදල් හා මූල්‍ය ස්ථායීතාව සුරක්ෂිත කිරීම සඳහා අර්බුදකාරී අවධිවලදී පද්ධතිමය ද්‍රවශීලතා ගැටලු විසඳීම පිණිස මහ බැංකුවේ මැදිහත් වීම
12. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව සහ එහි ඉදිරි ගමන
13. ශ්‍රී ලංකාව තුළ මූල්‍ය ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීම
14. ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග






# ස්තූතියි!